මගේ අංකය
எனது இல.
My No. RG/NB/1/චක්‍රලේඛ

ඔබේ අංකය
உமது இல.
Your No.

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. 2889488 2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. 2889491

ඊ මේල්
மின்னஞ்சல்
E-mail info@rgd.gov.lk rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகத் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

වෙබ් අඩවිය
இணையத்தளம்
Web site www.rgdept.lk

දිනය / திகதி / Date: 2017.09.( )

චක්‍රලේඛ අංක: - 03/2017

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

19 SEP 2017

**ලේඛන ලියාපදිංචි කිරීම සම්බන්ධ සටහන් නිසිමත්ව ලියාපදිංචි කිරීම.**

බොහෝ කාර්යාල වල ලේඛන ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් ලියාපදිංචියට ලැබෙන ඔප්පුවේ හෝ ලේඛනයේ සඳහන් තොරතුරු ඉඩම් ලේඛනයේ (ඒ 4) සටහන් කිරීමේ දී නිවැරදිව ඉටු නොකරන බව මා වෙත වාර්තා වී ඇත.

02. මේ සම්බන්ධයෙන් වරින් වර නිකුත් කර ඇති උපදෙස් වලට අමතරව දෙපාර්තමේන්තු අත්පොතෙහි 237 සිට 302 දක්වා වූ නියෝගයන් වල සඳහන් පරිදි කටයුතු කරන බවට ඔබ විසින් සැහීමකට පත් විය යුතු බව මෙයින් දන්වමි. එමෙන්ම ලේඛනයට අත්සන් තබන නිලධාරීන් විසින් ද, ලියාපදිංචි ලිපිකරුවන් විසින් තබන සටහන් නිවැරදි දැයි පරීක්ෂා කර අත්සන් කරන බවට ඔබ වගබලා ගත යුතු බව තව දුරටත් දන්වමි.

03. මීට අමතරව "ඒ4" ලේඛනයේ දීමනාකරුවන් සහ ගැනුම්කරුවන් සම්බන්ධයෙන් අදාල තොරතුරු සටහන් කිරීමේ දී කිසියම් ඔප්පුවක හෝ ලියාපදිංචි කිරීමට ලැබෙන ලේඛනයක පාර්ශවකරුවන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර ඇති විටක එම ජාතික හැඳුනුම්පත් අංකය අදාල වන පරිදි දීමනාකරුවන් හෝ ගැනුම්කරුවන් සම්බන්ධයෙන් සටහන් කරන ලෙසට ලියාපදිංචි කිරීමේ සියලුම නිලධාරීන් දැනුවත් කර ඒ බව මා වෙත වාර්තා කරන ලෙස වැඩි දුරටත් දන්වමි. කිසියම් ඔප්පුවක හෝ ලේඛනයක ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර ඇතුළත් කර නොමැති නම් එය ලියාපදිංචි නොකර සිටීමට හේතුවක් නොවිය යුතු බව විශේෂයෙන් සිහි තබා ගත යුතු බව ද දන්වමි.

04. මෙම චක්‍රලේඛ ලිපිය ලද බව දන්වන්න.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත : 1. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැන ගැනීම සඳහා

2. සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

රංජිත් දයානන්ද
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්